# 3 ව්‍රෑණත්තී උධශෂ් තෂඩ්ඹ

මෙම කරුණු the-catamaran.org ව්‍යාපෘතියේ ම කොටසකි

ජනමාධ්‍යවේදියාට කෙටි මං : මුද්‍රිත හා අන්තර්ජාල වාර්තාකරණයේ මූලිකාංග

## 3.1 ව්‍රෑණත්තීයඛ් ෂඩශෘ ෂූ°ෂූ වීෂයණ් තෂෘයෘ ගණ්තණ් තඛතශණ් ධ?

බොහොමයක් ප්‍රවෘත්ති අදහස් වර්තමානයේ පවතින සිදුවීම්වලින් උද්ගත වේ - උදාහරණයක් ලෙස, පාර්ලිමේන්තුවේ ඡන්දයක්, සංස්කෘතික උත්සව, අනතුරු, ව්‍යසන ආදිය ගත හැකිය. පත්‍රකලාවේදීන් මෙම සිද්ධීන් පිළිබඳව පර්යේෂණය කර ඒවා විස්තරාත්මකව, ඉලක්කගතව හා යෝග්‍ය ආකාරයකින් මහජනයාට ඉදිරිපත් කරයි.
ඒ අතරම, පත්‍රකලාවේදියෙක්ට වර්තමානයේ ඇති සිදුවීම් නොවන මාතෘකා සම්බන්ධයෙන් ද වාර්තා කළ හැකිය. නැවුම් ප්‍රවෘත්ති අදහස් මතුකර ගැනීමත් වර්තමානය වන විට ජනතාවගේ ඇස නොගැසුනු මාතෘකා සම්බන්ධයෙන් නව මානයන් නිර්මාණය කර ගැනීමත් පත්‍රකලාවේදියෙක්ගේ කාර්යභාරයේ කොටසක් වේ.

## 3.2 තඹ්‍ය ඛීරිඹ ෂඩශෘ ඵත්‍රබලෘතඟධීත්‍යඛ් වීෂීණ් ඵශත ධෑඛ්තණා වීධී බධ්‍යූතු බළ යූතුයථ

ඔහු හෝ ඇය අවට සාමාජීය, දේශපාලන හා සංස්කෘතික ක්ෂේත්‍රවල සිදු වන දේ පිළිබඳව යාවත්කාල විය යුතු වන අතර සිදු වන්නේ කුමක් ද යන්න විශ්ලේෂණය කිරීමටත් ප්‍රශ්න කිරීමටත් සමත් විය යුතුය.
උදා. ලෙස සභා රැස්වීම් වැනි නිල දින සම්බන්ධයෙන් දිනපොතක් පවත්වා ගෙන යන්න - මෙය ඔවුන්ගේ ප්‍රවර්තන කාර්යය නොවුව ද එම දිනවල දී සිදු වන්නේ කුමක් ද යන්න පිළිබඳව දැනුවත් වෙන්න. තොරතුරු සැපයිය හැකි තැනැත්තන් සමඟ සම්බන්ධතා ගොඩනඟා ගන්න. ප්‍රවර්තන හා අනාගත පර්යේෂණවල දී උපකාරී විය හැකි තැනැත්තන්ගේ නම් හා ඔවුන් සම්බන්ධ කර ගත හැකි විස්තර තබා ගන්න. මෙය "සම්බන්ධතා පොතක්" පවත්වා ගෙනයාම හැඳින් වේ.
අනෙකුත් සියලුම මාධ්‍ය වාර්තාවලට අවධානය යොමු කරන්න - බොහෝවිට කීමට තිබෙන ප්‍රවෘත්තියක් තිබෙන අතර පත්‍රකලාවේදියාට තවදුරටත් කටයුතු කළ හැකි අනෙකුත් වාර්තාවලින් පිළිතුරු නොදුන් ප්‍රශ්න තිබිය හැකිය.
වෙනත් පුද්ගලයින්ගේ පෞද්ගලික ජීවිත හා ජනකොට්ඨාස සම්බන්ධයෙන් විවෘත වෙන්න. මිනිසුන්ට දැනෙන, ඔවුන් සිතන, කියන, ඔවුන් වාද කරන, ඔවුන්ව යොමු කරවන හා ඔවුන් සැලසුම් කරන දෙයට ඇහුම් කන් දෙන්න. ඒ තුළ ප්‍රවෘත්තියක් තිබිය හැකි වන අතර එය මහජන අදහස් දැන ගැනීමේ ඉතා හොඳ මාර්ගයක් ද වේ.
දැනගැනීමට උනන්දු වන්න. පත්‍රකලාවේදියෙක්ට කිසියම් මාතෘකා පිළිබඳව ප්‍රශ්න තිබෙන්නේ නම් හෝ කිසියම් දෙයක් පිළිබඳව වැඩිදුරටත් දැන ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඔහු හෝ ඇය ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර ගෙන යා යුතුය. ඒ තුළ ප්‍රවෘත්තියක් තිබිය හැකිය.

## වීඛ්ෂූඨ්‍යෟ ලෑඊෂ්තුනඃ ඹඹ ව්‍රෑණත්තී උධශෂ් තෂෘයෘ ගණ්තණ් තඛෘතශණ් ධ?

1 සියලුම ආකාරයේ මාධ්‍ය වාර්තාවල.

2 පුවත්පත් නිවේදනවල සහ දේශපාලන පක්ෂ, ආයතන, කණ්ඩායම් හා සංවිධානවල වෙබ් අඩවිවල.

3 පුවත්පත් සාකච්ඡාවල දී.

4 වෙළඳ ප්‍රදර්ශනවල දී හෝ වෙනත් රැස්වීම්වල දී.

5 මගේ සම්බන්ධතා පොතෙන්.

6 අන්තර්ජාලයෙන් හෝ බ්ලොග් හරහා.

7 මගේම දෛනික ජීවිතය තුළින්.

This project is funded by the European Union